# රජ දැක්මට කොඩි දැම්ම හැටි





**දිගු දුෂ්කර ගමණකට පසු ලොරිය නතර විය. ඉන් ඉවතට පැනගත් අපට පේන තෙක් මානයක වික්ටෝරියා ජලාශයක් නම් නොපෙනුණි. ඒ වෙනුවට තිබුණේ වංගු සහිතව දෙපසට විහිදෙන මහා මාර්ගයක් සහ දෙපස තිබූ අර්ධ වගා - අර්ධ කැලෑ බිම්ය. අනෙක් ලොරියේ පැමිණි සිසුන් කණ්ඩායම ද අප හා එක්විය. එවිටම, කොහේදෝ සිට එතැනට පාත්වූයේ යකඩ ඉණි, නාරස්සන තොගයකි. දෙදිසාවට විහිදෙන මහා මාර්ගය දෙපසම යකඩ ඉණි වලින් ඇණ සකසා කොඩි සිටවීමට අපට ජ්‍යෙෂ්ඨ ජුන්ටා ශිෂ්‍යයින්ගෙන් අණ ලැබුණි. නවක සිසුන් වූ අප වෙනුවෙන් සංවිධානය කර තිබූ විනෝද චාරිකාවේ සැබෑ අරමුණ මේ වන විට අපට පැහැදිලි වී හමාරය.**

මම ඉරිදා ලක්බිම පත්‍රයේ "අම්බලන්ගොඩයා ගේ කොලම" එය පලවෙන සෑම සතියකම අන්තර්ජාලය ඔස්සේ නොවරදවාම කියවමි. ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න (බාහු) ලියන "නිනච්ච" තීරු ලිපිය ද, සුන්දර නිහතමානී ද මැල් ලියන "මානි ගේ තීරුව" ද කියවන්නේ ඉන් පසුවය. අම්බලන්ගොඩයාගේ කොලම වැනි තීරු ලිපියක් මා මුලින්ම කියවූයේ හැත්තෑව දශකයේ දී බව මගේ මතකයයි. ඒ නවයුගය සඟරාවේ පලවූ, පුවත්පත් කලාවේදී කාරියකරවන රචනා කළ, "හපන්කම්, මෝඩකම්, පුරසාරම්" කොලම විය. අම්බලන්ගොඩයා ගේ කොලම ද හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී බුද්ධික කුරුකුලරත්න ගේ හපන්කම්, මෝඩකම් හා පුරසාරම් වලින් නොඅඩුව පිරී ඇති රස සාගරයකි.

පසුගිය ඉරිදාවක "අම්බලන්ගොඩයා ගේ කොලම" යටතේ එංගලන්ත රැජින ගේ දෙවන ලංකා ගමන ගැන ලියවී තිබෙනු දැක මගේ සිත ඒ ලිපියේ සඳහන් වූ වකවානුවට, එනම් 1981 ඔක්තෝබරය ට ඇදී ගියේය.

එදා එලිසබෙත් රැජින වික්ටෝරියා ජලාශය විවෘත කිරීමට මහනුවරට පැමිණෙන විට මා පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුලත් වී මාසයක්වත් ගතවී නොතිබුණි. විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් අතර අම්බලන්ගොඩයා වැනි යූ.ඇම්.පී. කාරයන් හැඳින්වුනේ "ජුන්ටන්" ලෙසය. මෙම වචනය සිංහල භාෂාවට එක් වී තිබුනේ, ඇතැම් විටෙක "හුන්ටා" කියා ද ශබ්ද කෙරෙන, ස්පාඤ්ඤ වචනය අනුසාරයෙනි. එයින් අදහස් කෙරුනේ බලහත්කාරයෙන් පාලන බලයේ රැඳී සිටින කල්ලිය යන්නයි. මෙය පොදුවේ සියළු යූ.ඇම්.පී. කාරයනුත්, විශේෂයෙන්ම විශ්ව විද්‍යාල තුල සිටි එජාපයට අනුබද්ධ සමවාදී ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින් හැඳින්වීමටත් යොදගත් සුරතල් විකට නාමයක් විය. මේ සමවාදී ශිෂ්‍ය සංගමයේ අනුසාශකයා වූයේ එවකට මහවැලි ඇමති ගාමිණී දිසානායක ය.

මේ කාලය වන විට සමසමාජ, කොමියුනිස්ට් ආදී පැරණි වාමාංශික දේශපාලන පක්ෂ වලට සම්බන්ධ ශිෂ්‍ය සංගම් පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් සහමුලින් ම නැතිවී ගොස් තිබුණි. පෞද්ගලික මට්ටමෙන් නව සමසමාජ පක්ෂය ට සම්බන්ධ වූ සිසුන් දෙතුන් දෙනෙක් කලා පීඨය තුල සිටියහ. මහා ශිෂ්‍ය සභාවේ බලය හිමි වී තිබුණේ ජ.වි.පෙ.ට සම්බන්ධ සමාජවාදී ශිෂ්‍ය පෙරමුණට විය. මේ සඳහා ඔවුන් ට ඉංජිනේරු පීඨ ස්වාධීන කණ්ඩායම ඇතුළු තවත් පීඨ කණ්ඩායම් වල ආධාරය ලැබුනි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ නිදහස් ශිෂ්‍ය සංගමයට කලා පීඨය තුල සුළු බලයක් හිමි වී තිබුනු අතර, ජ.වි.පෙ.ට එරෙහි ප්‍රධානතම බලවේගය වූයේ එක්සත් ජාතික පක්ෂයට අනුබද්ධ පෙරකී සමවාදී ශිෂ්‍ය සංගමය යි.

රටේ ජුන්ටෝ විශාල වශයෙන් සිටියද, පේරාදෙනිය විශ්ව විද්‍යාල තුල නම් ජුන්ටෝ සිටියේ සුළුතරයකි. එසේ වුවද, එවකට පැවති එ.ජා.ප. රජයේ අනුග්‍රහයෙන්, ඔවුන් ගේ බල පරාක්‍රමය කැපී පෙනුණි. ගාමිණී දිසානායක ඇමතිවරයා අනුශාසක ධූරය දැරූ සමවාදී ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරිකයෙක් වීම, උපාධිය ලැබූ පසු ඉක්මනින් ම රජයේ, විශේෂයෙන් ම මහවැලියේ, රැකියාවක් ලබා ගැනීම සහතික කරන්නක් විය. ශිෂ්‍ය නේවාසිකාගාර වල සියළුම පූර්ණ කාලීන උප-ශාලාධිපතිවරු සමවාදී ශිෂ්‍ය සංගමයේ හිටපු නායකයෝ වූහ. මේ එ.ජා.ප. බලය කලා පීඨය තුල ප්‍රධාන වශයෙන් කේන්ද්‍ර ගත වී තිබුණි. මින් අදහස් කෙරෙන්නේ අනෙකුත් පීඨ වල සිටි එ.ජා.ප. හිතවතුන් බොහෝ විට නිහඬව සිටි බවයි.

මා මුලින්ම පේරාදෙනිය විශ්ව විද්‍යාල භූමියට පා තැබුවේ 1981 ඔක්තෝම්බර් හතර වෙනි ඉරිදා ය. මට නේවාසික පහසුකම් ලැබුණු "මාකස් ප්‍රනාන්දු" ශාලාව කලා පීඨ ජුන්ටන් ගේ රජ දහනක් විය. මෙහි පූර්ණකාලීන උප ශාලාධිපති වශයෙන් සිටි ෂර්වින් ද හිටපු ජුන්ටා නායකයෙකු බව මම පසුව දැන ගතිමි. පසුදා අපේ පාඨමාලාව ඇරඹුණු අතර, මම ඒ සති අන්තයේ ද, ඉන් පසු සතිඅන්තයේ ද සිකුරාදා සවස නිවසට ගොස් ඉරිදා සවස ආපසු පැමිණියෙමි.

තුන්වන සතිය වන විට තත්වය වෙනස් විය. සතියේ මැද දිනක, අපේ කාමරවලට පැමිණියේ කලා පීඨ අවසාන වසරේ සිසුන් කිහිප දෙනෙකි. ඔවුන් ගේ තනි නොතනියට දෝ උප ශාලාධිපති ද ඔවුන් පිටු පසින් විය.

"මේ සති අන්තයේ ෆ්‍රෙෂාලාට (පළමු වසර සිසුන් ට) වික්ටෝරියා ජලාශය බලන්න අපි ට්‍රිප් එකක් ලෑස්ති කරල තියෙනවා. උඹලා ඔක්කොම එන්න ඕනැ. හරිද?" අපට දැනුම් දීමක් කෙරිණි.

"මං ගෙදර යන්නයි ඉන්නේ!" මම කෙඳිරීමි.

"මේ සතියෙ නොගිහිං හිටපං, මේ වගේ චාන්ස් එකක් ආයෙ එන්නෙ නෑ. ට්‍රිප් එක නොමිලේ!" පිළිතුරු ලැබිණ.

"නාවොත් කරදර වේවි!" යන්න අපට හොඳින් ම තේරුණි. උප ශාලාධිපති ද එහි සිටි නිසා යම්කිසි සැනසිල්ලක් ද දැනුන බව කිව මනාය. සති අන්තයේ නොඑන බව කියා මම පසුවදම නිවසට තැපැල් පතක් යොමු කළෙමි.

සති අන්තයේ ඉරිදව උදාවිය. ජ්‍යෙෂ්ඨ ජුන්ටන් ගේ අණ නොතකා, සති අන්තයේ නිවසට යෑමට තරම් නිර්භීත වී සිටි කිහිප දෙනෙකු හැර, අප සියළු දෙනාම අණ ලැබී තිබුණු ආකාරයට හිල්ඩා ශාලාව අසලට උදේ රැයින්ම ගියෙමු. ගම දුර බැහැර නිසා සති අන්තයේ නිවෙසට යෑම නොකළ, යාපනයේ, මඩකලපුවේ සිසුහු ද බුරුතු පිටින් එහි සිටියහ.

එදා අපේ වික්ටෝරියාව බැලීමට යෑමේ සංචාරය සඳහා, මනරම් සංචාරක බස්රියක් හෝ අඩු තරමින් කුලියට ගත් ලංගම බසයක් හෝ බලාපොරොත්තුවෙන් සිටියා නම් එය සිහිනයක් පමණක්ම විය. මද වේලාවකින් අප අසල නතර කෙරුණේ විශ්ව විද්‍යාලයට අයිති ලොරි බාග කිහිපයකි. රජරට සිට මස් කිරීමට ගෙන යන හරක් රංචු පිටින් ගාල් කරන්නාක් මෙන් අපව, ඒ ලොරි වල පිටු පස කොටසට නංවනු ලැබිණ. වාසනාවකට මෙන් මා සිටි ලොරියේ පිටු පස දෙර පළුවල ඉහල කොටස විවෘතව තැබුණු නිසා වාතාශ්‍රය පිළිබඳ විශාල ප්‍රශ්ණයක් පැන නොනැ-ග්ගද, පේරාදෙනියේ සිට වික්ටෝරියා ජලාශය ප්‍රදේශයට අප එදා කළ ඒ ගමන අන්තරාකාරී එකක් වූ බව අමුතුවෙන් කිවයුතු නැත. ලොරියේ මැද, සිට ගෙන, එකිනෙකාට වාත්තුවෙමින් නොවැටී සිටීමට උත්සාහ කරමින් කළ අපේ ගමනේ කාන්සිය නිවුනේ දෙරටුව ලඟ සිටීමට වාසනාවන්ත වූ සිසුන් කිහිප දෙනෙකු අත්පුඩි ගසමින් ගායනා කළ ගී නිසාය.

දිගු දුෂ්කර ගමණකට පසු ලොරිය නතර විය. ඉන් ඉවතට පැනගත් අපට පේන තෙක් මානයක වික්ටෝරියා ජලාශයක් නම් නොපෙනුණි. ඒ වෙනුවට තිබුණේ වංගු සහිතව දෙපසට විහිදෙන මහා මාර්ගයක් සහ දෙපස තිබූ අර්ධ වගා - අර්ධ කැලෑ බිම්ය. අනෙක් ලොරියේ පැමිණි සිසුන් කණ්ඩායම ද අප හා එක්විය. එවිටම, කොහේදෝ සිට එතැනට පාත්වූයේ යකඩ ඉණි, නාරස්සන තොගයකි. දෙදිසාවට විහිදෙන මහා මාර්ගය දෙපසම යකඩ ඉණි වලින් ඇණ සකසා කොඩි සිටවීමට අපට ජ්‍යෙෂ්ඨ ජුන්ටා ශිෂ්‍යයින්ගෙන් අණ ලැබුණි. නවක සිසුන් වූ අප වෙනුවෙන් සංවිධානය කර තිබූ විනෝද චාරිකාවේ සැබෑ අරමුණ මේ වන විට අපට පැහැදිලි වී හමාරය. යුධ සිරකරුවන් පිරිසක් වහල් සේවයට ගෙනයන්නාක් මෙන් අපව ලොරිවල පටවා ගෙනවිත් තිබුණේ, වික්ටෝරියා ජලාශය විවෘත කිරීමට එහි පැමිණීමට නියමිත එලිසබෙත් රැජින ගමන් කරන මාර්ගය දෙපස සිංහ කොඩි සහ යූනියන් ජැක් සිටුවීමටය. මෙය එජාපයට සමබන්ධ සමවාදී ජුන්ටන් විසින් බාර ගෙන තිබුණු පක්කාලි කොන්ත්‍රාත්තුවකි.

ටික වේලාවකින් එහි පැමිණි ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙකු ගේ අනුග්‍රහයෙන් අපට කිරිබත් සහ තක තේ ස්වල්පයක් ද, ඉර අවරට ගිය පසු තැම්බූ මයියොක්කා සංග්‍රහයක් ද ලැබුණි. අපි විටින් විට අසල වතුවල තිබූ කොකෝවා ගස් සහ දුව පනිමින් සිටි එළුවන් අතරින් ගොස් ලිඳකින් වතුර ඇද බී දහය නිවාගත්තෙමු. සවස් කාලයේ යලිත් ලොරි වලට ගාල් කරනු ලැබූ අප විශ්ව විද්‍යාල භූමියට ගෙනවිත් මුදා හරිනු ලැබිණ. අපේ වික්ටෝරියා ජලාශය නැරඹීමේ විනෝද චාරිකාව එතැනින් නිමවිය.

වසර විසි හයකටත් එහා කාලයක සිදුවූ මේ සිද්ධිය යලි සිහිපත් වෙන විට නැගෙන කෝපය අතරින් සිතට යම් සතුටකුත් නැගේ. අදාල කරුණු කාරණා කෙසේ වූවත් මේ මා සම වයසේ තරුණ පිරිසක් සමග ගිය ප්‍රථම චාරිකාවයි. ලොරියේ හිරවී යද්දී අප ගී ගැයූ ආකාරය මට එක් කරුණක් නිසා කිසි දිනක අමතක නොවේ. එනම්, සහෝදර දෙමල සිසුන් බාලසුභ්‍රමනියම් වැන්නෙකු ගේ ගීතයක් ගැයූ විට අපට එම තනුවටම සෑදූ ජෝති ගේ හෝ මිල්ටන් ගේ ගීතයකින් පිළිතුරු දෙන්නට හැකි වීමයි. මේ බොහෝ ගීත එකම හින්දි තනුවක කාබන් කොපි විය. දෙමලෙන් "අඩී, එන්නඩී" ගැයුණු පසු අපි "මම ගන්නෙමී" ගැයුවෙමු. අපි (කඳ සුරිඳුනි) "අප ඔබ දැකුමට ආවා" ගයා නිමකල පසු ඔව්හූ "මුරුගා වඩිවේලා" ගැයූහ. අපේ ගමන කෙටි දුරක් වූවද, එය එකම විනෝද සාගරයක් විය.

මේ ලිපිය අවසාන කිරීමට පෙර වික්ටෝරියා ජලාශය විවෘත කිරීමේ රාජ්‍ය උත්සවය ගැන වැඩි දෙනෙකු සමහරවිටක නොදන්නවා විය හැකි කරුණක් පාඨකයින් ගේ දැන ගැනීම පිණිස කිව යුතුව ඇත.

මේ උත්සවය සම්බන්ධයෙන් මහනුවර ප්‍රදේශය පුරා කොල පැහැයෙන් මනරම් ලෙස මුද්‍රිත අති විශාල වූ පෝස්ටර් ඇලවිණ. එහි එක පෙලට සුදිලෙමින් තිබූ මුහුණු ත්‍රිත්වයකි. ඒවා, එලිසබෙත් වින්ඩ්සර්, ජූනියස් රිචඩ් සහ ලයනල් ගාමිණී ගේ විය. මහවැලියේ තාත්තා කවුරු වුවද, බාප්පා කවුරු වුවද, මේ පෝස්ටර්වල පාප්ප වේලෙන්නටත් පෙර ඒවා අදිසි හස්තයකින් මෙන් ගැලවී ගියේය. ඒ වෙනුවට අළුත් පෝස්ටරයක් තොග පිටින් ඇලවුණි.

ඒ පසුව ඇලවුණු පෝස්ටරයේ තිබුණේ එකම වෙනසකි. රාජ්‍ය තාන්ත්‍රික නායකත්ව පටිපාටිය අනුගමනය කෙරෙමින් ඉහත මුහුණු ත්‍රිත්වය අතරට තවත් එක් මුහුණක් එක් වී තිබුණි. ඒ රණසිංහ ප්‍රේමදාස ගේ ය!

ර. චන්ද්‍රසූරිය

<ra.chandra.suriya@gmail.com>